# 1803 බ්‍රිතාන්‍යයන්ගේ උඩරට ආක්‍රමණය පිළිබඳ ඓතිහාසික විමසුමක්

**අතුකෝරාල ඒ.සී.එච්.**[1]

1803 උඩරට ආක්‍රමණය බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද පළමු යුදමය අතපෙවීම වශයෙන් පෙන්වාදිය හැකිය. එම යුදමය තත්ත්වය ඇතිවීමත් එහි විකාශනයත් ඒ ඔස්සේ දේශීය සමාජය තුළ සිදුවූ විචල්‍යයන් පිළිබඳත් අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණයි. ඓතිහාසික මූලාශ්‍ර ගණයට අයත් බ්‍රිතාන්‍යයන්ගේ වාර්තා සහ දේශීය සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර තුළින් ලබාගන්නා තොරතුරු ඔස්සේ මෙම පර්යේෂණය සිදුකිරීමට කටයුතු කරයි. 1796 දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ බ්‍රිතාන්‍යයන්ගේ ග්‍රහණයට ලක්වීමත් සමඟ උඩරට හා පහතරට ප්‍රදේශ අතර යම් මතභේදාත්මක තත්ත්වයන් වර්ධනය විය. මුහුදුබඩ කලාපයේ 1797 දී ඇතිවූ කැරලි සඳහා උඩරට පාලකයන්ගේ සහය වක්‍රාකාරයෙන් ලැබූ නමුත් උඩරට යටත් කරගැනීමට උත්සාහ දරමින් සිටි බ්‍රිතාන්‍යයන්ට එය යුධ වැදීමට තරම් ප්‍රමාණවත් කරුණක් නොවිණි. 1798 දී රාජාධිරාජසිංහ රජුගේ අභාවයත් සමග උඩරට රාජ්‍යත්වය පිළිබඳ ඇතිවූ ගැටලුවත් එහිදී කන්නසාමි කුමරු පිළිමතලව්වේ අධිකාරමගේ සහයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ නමින් බලයට පත්වීමත් බ්‍රිතාන්‍යයන්ගේ දැඩි අවධානයට ලක්විය. මේ සමගම ඇතිවූ උඩරට රදළ සහ නායක්කර් වංශික මත ගැටුම උඩරටට ආක්‍රමණයක් එල්ලකිරීම සඳහා සුදුසු පසුබිමක් සකසන බව බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර ප්‍රෙඩ්රික් නෝර්ත් අවබෝධ කරගන්නා ලදී. යුද්ධයක් සඳහා හේතුවක් සොයමින් සිටි බ්‍රිතාන්‍යයන්ට 1802 ජූලි මස පහතරට මුස්ලිම් වෙළෙඳුන් පිරිසකට පිළිමතලව්වේ හිරිහැර කිරීම පාදක කරගෙන 1803 ජනවාරි 31 දින උඩරට රාජ්‍යයට එරෙහිව යුධ ප්‍රකාශ කරන ලදී. කොළඹින් හා ත්‍රිකුණාමලයෙන් සේනාංක දෙකක් මහනුවරට ආක්‍රමණ දියත් කළ අතර ඔවුන් 1803 පෙබරවාරි මස මහනුවරට ඇතුළු විය. මහනුවර නගරය සියතට ගත් බ්‍රිතාන්‍යයන් මුත්තුසාමි කුමරු රාජ්‍යත්වයට පත් කරන ලදී. නමුත් උඩරට රාජ්‍යයේ දේශගුණය නුපුරුදු වීම මත බ්‍රිතාන්‍ය සොල්දාදුවන් අපහසුතාවලට ලක්වූ අතර වටපුළුව ප්‍රදේශයේදී ඇති වූ සටනින් බ්‍රිතාන්‍ය සොල්දාදුවන් සමූල ඝාතනය කරමින් ලබාගත් මෙම ජයග්‍රහණයෙන් පසුව ඉංග්‍රීසි සේනා ලුහුබැඳ හංවැල්ල දක්වා සියසේනා මෙහෙයවූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු යළිත් සිය අණසක උඩරට රාජ්‍යය තුළ ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. මෙම සිදුවීම වන කාලපරාසය තුල උඩරට රාජ්‍යයේ සමාජ, දේශපාලන පසුබිම පිළිබඳවත් උඩරට ජනයා සතුව පැවති රාජපාක්ෂිකභාවය පිළිබඳවත් උඩරට පාර්ශ්වය ජය ගැනීමට හා බලසම්පන්න බ්‍රිතාන්‍යයන් පරාජය වීමට බලපෑ හේතු පිළිබඳවත් ලාංකිකයන් ජයග්‍රහණය කළ මෙම ගැටුම සම්භාවනාවට පාත්‍ර නොවීමට හේතුවූ කරුණු ගණනාවක් හඳුනාගත හැකිය. ඒ අනුව 1803 පළමු උඩරට අරගලය බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ දී ලද ප්‍රථම සහ එකම පරාජය ලෙස පෙන්වාදිය හැකිය.

**මුඛ්‍ය පද :** උඩරට රාජධානිය, බ්‍රිතාන්‍යයන්, මහනුවර, ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා, ප්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා

[1]පේරාදෙණිය විශ්වවිද්‍යාලය. chamiathukorala97@gmail.com